# කළමනාකරණ කමිටු රැස්වීම.

දිනය - 2017.02.13

වේලාව - ප.ව. 02.00

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

මූලාසනය - එම්.ජී.බී. දයා සෙනරත් මයා (ප්‍රධාන ලේකම් - බ.ප.)

සහභාගී වූ නිලධාරීන්,

- **කේ.කේ.චම්පිකා කනේරු මිය**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)**
- **සිරිසෝම ලොකුවිතාන මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)**
- **එන්.බන්දුල ප්‍රේමකුමාර මයා.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)**
- **ඩී.එම්.එන්. දිසානායක මිය.**
  **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)**
- **චම්පිකා පතිරණ මිය.**
  **ප්‍රධාන අභ්‍යන්තර විගණක.**
- **ජී.ජී.එන්. ජයන්ත මයා.**
  **ආදායම් කොමසාරිස් (බ.ප)**
- **ජී.ඩබ්ලිව්.ප්‍රියදර්ශනී පෙරේරා මිය.**
  **අධ්‍යක්ෂ (ඉංජිනේරු)**
- **පී. කණිෂ්ක ශ්‍රී ලාල් මයා.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)**
- **කේ.එන්.සූරියආරච්චි මිය.**
  **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)**

# සාකච්ඡා කරන ලද කරුණු

## පාලන අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | 2017 වසර සඳහා ඵලදායිතා ප්‍රවර්ධනය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන | ප්‍රධාන ලේකම් කාර්යාලයේ ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා එම අංශයන්හි නිලධාරීන් මෙහෙයවීම උදෙසා ක්‍රියා කිරීම හා ඔවුන්ට මෙහෙයුම් කමිටු, තත්ත්ව-කව පිහිටුවීම දක්වා ක්‍රියාකාරීත්වය පැහැදිලි කිරීමට ඵලදායීතා ලේකම් කාර්යාලයේ ප්‍රවර්ධන නිලධාරී ඉෂා රත්නකමල් මහතා පැමිණ සිටි අතර, ඔහු විසින් 2017 මාර්තු මස සිට මාස 03ක කාලයක් සඳහා ව්‍යාපෘති කාර්යය සටහනක් ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කරන ලදි.<br>ප්‍රධාන ලේකම් කාර්යාලයේ මාර්තු 01 දින සිට පාලන, පිරිස් හා පුහුණු, මූල්‍ය, සැලසුම්, ඉංජිනේරු, අභ්‍යන්තර විගණන හා ආදායම් දෙපාර්තමේන්තුව යන අංශ7 ආවරණය වන පරිදි ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීම හා තාක්ෂණික උපදෙස් ලබා දීම සඳහා ඵලදායීතා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වෙත ලිපියක් යොමු කිරීම.<br>පවත්නා තත්ත්වය ඵලදායීතා ලේකම් කාර්යාලය විසින් මාර්තු 01 දින විගණනය කරන බැවින්, ඒ සඳහා සහයෝගය ලබා දීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 02. | තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම | 2017 පෙබරවාරි 03 දින සිට තොරතුරු දැන ගැනීමේ පනත ක්‍රියාත්මක වන බැවින්, තොරතුරු දැන ගැනීමේ පනතට අදාළ ව සකස් කරන ලද සුචි ගත තොරතුරු අදාළ ප්‍රමාණයම පෙබරවාරි 28ට පෙර වෙබ් අඩවියට ඇතුළත් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 03. | ජාත්‍යන්තර වෙසක් උත්සවය 2017 | 2017 වර්ෂයේ ජාත්‍යන්තර වෙසක් උත්සවය ශ්‍රී ලංකාවේ පැවැත්වීමට සමගාමීව "බෞද්ධයා" නාලිකාව මඟින් සංවිධානය කරනු ලබන වෙසක් කලාපය සඳහා කුටි කිහිපයක් ලබා ගෙන ඉදිරිපත් කිරීමක් සිදු කිරීම.<br>ලේකම්වරුන්ගේ රැස්වීම සඳහා යෝජනාව ඉදිරිපත් කිරීම. | ප්‍රධාන ලේකම් කාර්යාලීය බෞද්ධ සංගමය.<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

## පිරිස් හා පුහුණු අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | තොරතුරු තාක්ෂණ සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුර | ප්‍රධාන ලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශය වෙනුවෙන් නව "සහකාර අධ්‍යක්ෂ" තනතුර සඳහා සුදුසු පුද්ගලයෙක් බඳවා ගැනීම සඳහා සේවා ව්‍යවස්ථාව සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති බඳවා ගැනීම් කටයුතු කඩිනම් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 02. | තාක්ෂණ නිලධාරීන් සහ තාක්ෂණ සහායකයින් බඳවා ගැනීම | තාක්ෂණ නිලධාරී බඳවා ගැනීම් පටිපාටි දැනටමත් අනුමැතිය සඳහා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇත.<br>තාක්ෂණ සහායකයින් පුරප්පාඩු බඳවා ගැනීම සඳහා අයදුම්පත් ලැබී ඇත.<br><br>ඒ අනුව, ඉදිරි කටයුතු කඩිනම් කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

## සැලසුම් අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | සංවර්ධන යෝජනා සම්බන්ධ ප්‍රගතිය | අමාත්‍යාංශ ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති වල පසුගිය වසරේ මූල්‍ය ප්‍රගතිය මෙන් ම භෞතික ප්‍රගතිය කෙරෙහි ද සැලකිලිමත් විය යුතු බව සහ වාර්තා ඉදිරිපත් කිරීම.<br><br>ඉදිකිරීම් නොවන සංවර්ධන ව්‍යාපෘති පසු විපරම් කළ යුතු අතර, එක් එක් අමාත්‍යාංශ මගින් මේ වන විට ඉටු කර නොමැති ව්‍යාපෘති වල තොරතුරු ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීම සහ ලේකම්වරුන්ගේ රැස්වීම වෙත යොමු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |

## ඉංජිනේරු අංශය

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | පළාත් සභාවේ ලේඛන සංරක්ෂණය සහ ක්‍රමවත් කිරීම. | ලේඛන සංරක්ෂණය කිරීම සහ කාර්යයන් පහසු කිරීමේ වැඩසටහන් සැකසීමේ දී, පහත විශේෂ ක්‍රම අනුගමනය කිරීම.<br>• පෙබරවාරි 04 සිට ලේඛන පරිලෝකනය කිරීමේ (scanning) ක්‍රමවේදයක් සැකසීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) හා සියලු ම අංශ ප්‍රධානීන් |

| | | | |
|---|---|---|---|
| 02. | රාජකාරි කටයුතු සඳහා අන්තර්ජාලය භාවිතයේ දී ඇති වන දෝෂ. | පසුගිය මාසය තුල සියලු නිලධාරීන් අන්තර්ජාලය භාවිතා කරන ලද ආකාරය පිළිබඳ වාර්තාවක් ලබා දෙන මෙන් බී.ඩී.පී.නිරන්ජන් මහතා වෙත ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 03. | වෙබ් පිටුව නිර්මාණය | මේ වන විට පළාත් සභාවේ සියලු අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු තම ආයතනයේ වෙබ්අඩවි සදා නිම කර සිටිය යුතු බැවින්, එම වෙබ්අඩවි නිරීක්ෂණය කිරීම සඳහා ඒවායෙහි වෙබ්-ලිපිනයන් විමසා ලිපි යොමු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

- ඉංජිනේරු අංශයට අදාළ ව පසුගිය වාර්තාවෙන් පෙන්වා දුන් ඉහත කරුණු ඉටු වී නොමැති බව වාර්තාවට ඇතුළත් කරන ලෙස ප්‍රධාන ලේකම් උපදෙස් ලබා දෙන ලදි.

| | | | |
|---|---|---|---|
| 04. | රියදුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම | 2018 වසරේ නව පරිශ්‍රය වෙත යන තෙක් දැනට පවතින ක්‍රමවේදය පවත්වාගෙන යාම සහ නව පරිශ්‍රයේ දී පරිශ්‍රයට ඇතුළු වන හා පිට වන සියලු වාහන ස්වයංක්‍රීයව තොරතුරු පද්ධතියට ඇතුළු වන ආකාරයට වැඩසටහනක් නිර්මාණය කිරීම.<br><br>2018 වසරේ දී රියදුරු ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

## <u>අභ්‍යන්තර විගණන අංශය</u>

| අනු අංක | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| 01. | අමාත්‍යාංශ වෙත අනුයුක්ත කරන ලද විගණන නිලධාරීන්ගේ විගණන සැලැස්ම සහ අධීක්ෂණය | අමාත්‍යාංශ වෙත අනුයුක්ත කරන ලද විගණන නිලධාරීන්ගේ විගණන සැලැස්ම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිත ව ප්‍රධාන අභ්‍යන්තර විගණන වෙත යොමු කිරීමටත් එය සමාලෝචනය කර අනුමැතිය ලබා දීමටත් තීරණය විය.<br>එම නිලධාරීන් අධීක්ෂණය අභ්‍යන්තර විගණන අංශයෙන් ගිලිහීමට අවස්ථාව ලබා නොදිය යුතු බව ද ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදී. | ප්‍රධාන අභ්‍යන්තර විගණක |